# ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවය
# 2022

## "අනාගතයට ආයෝජනයක්"

ආර්.බී නිශ්ශංක ප්‍රණාම
උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල



## ආර්.බී.නිශ්ශංක ප්‍රණාම උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල
## වැල්ලවාය

**(ශිෂ්‍යත්ව ප්‍රදානය 2022 අප්‍රේල් මස 17 දින පෙ.ව.8.30ට**
**මො/මල්වත්තාවල ම.ම.වි රංග ශාලාවේදී)**

**ආර් බී නිශ්ශංක ප්‍රණාම උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල - වැල්ලවාය**

**අරමුදලේ දැක්ම, මෙහෙවර සහ සාරධර්ම**

## <u>දැක්ම (Vision)</u>

උසස් අධ්‍යාපනය සඳහා සිසුන් දිරිගැන්වීම

## <u>මෙහෙවර (Mission)</u>

වැල්ලවාය ප්‍රදේශයේ පාසල් වලින් උසස් අධ්‍යාපනයට යොමුවන දක්ෂ සිසුන් සඳහා මුල්‍යාධාර ලබාදීම

## <u>සාරධර්ම (Values)</u>

1. **අවංකභාවය (Integrity):** අරමුදලේ සියලු කටයුතු අවංකව සිදුකිරීම
2. **විශ්වාසනීයත්වය (Trustworthiness):** අරමුදල හා සම්බන්ධ සියලු පාර්ශවකරුවන්ගේ විශ්වාසය තහවුරුවන පරිදි ක්‍රියා කිරීම
3. **පාරදෘශ්‍යභාවය (Transparency):** අරමුදල් රැස්කිරීම, ගිණුම්ගත කිරීම, ආයෝජනය සහ ශිෂ්‍යත්ව පිරිනැමීම විනිවිද භාවයෙන් යුක්තව සිදුකිරීම
4. **වගකීම්සහගතභාවය (Accountability):** අනුග්‍රාහකයින් සහ පරිත්‍යාගශීලීන් ලබාදෙන දායක මුදල් සඳහා සම්පූර්ණ වගකීම
5. **සහකම්පනය (Empathy) :** ශිෂ්‍යත්වලාභීන්ගේ අවශ්‍යතා කෙරෙහි සංවේදී වීම
6. **සමානාත්මතාවය (Equality):** සියලුමදෙනා සම තත්ත්වයෙහිලා සැළකීම
7. **සාමූහිකත්වය (Team Work) :** අරමුදලේ සියලු කටයුතු ක්‍රියාකාරී සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් එකමුතුව එක්සත්ව සහ සමගියෙන් සිදුකිරීම

## පෙරවදන

වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි අ.පො.ස. (උසස් පෙළ) විෂයධාරා උගන්වනු ලබන පාසල් සංඛ්‍යාව 06 කි. මෙම පාසල් වලින් වසරකට දරුවන් 50 - 60 පමණ විශ්වවිද්‍යාල වරම් ලබයි. මෙම දරුවන් අතරින් වැඩි පිරිසක් අඩු ආදායම්ලාභී පවුල්වල දරුවෝ වෙති. තම දෙමව්පියන්ට ස්ථිර ආදායම් මාර්ගයක් නොමැතිකම නිසා ඔවුන්ට සිය අධ්‍යාපන කටයුතුවලදී බොහෝ දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවනබව නොරහසකි..

"ආර්. බී. නිශ්ශංක ප්‍රණාම උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල" 2020 වර්ෂයේ ජනවාරි මාසයේදී ආරම්භ කරන ලද අතර එය පිහිටුවීමේ ඒකායන අරමුණ වන්නේ වැල්ලවාය ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල දක්ෂ දරුවන්ගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා අත්වැලක් සැපයීමයි. 1970 දශකයේ මැද භාගයේ වැල්ලවාය මල්වත්තාවල මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිවරයෙකු ලෙස කටයුතු කරමින් ප්‍රදේශයේ අධ්‍යාපන කටයුතු වලට මහඟු සේවාවක් ඉටුකළ ආර්. බී. නිශ්ශංක ගුරුපියාණන්ගේ නමින් මෙම අරමුදල නම් කර ඇත. එතුමාගෙන් ආරම්භවූ අධ්‍යාපන නවෝදයේ ප්‍රතිඵලයක් ලෙස වැල්ලවාය මල්වත්තාවල මධ්‍ය මහා විද්‍යාලයෙන් බිහිවූ විද්‍යාර්ථීන් කණ්ඩායමක් විසින් මෙම අරමුදලේ මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබයි.

අදවනවිට මෙම සත්කාර්යයේ වැදගත්කම අවබෝධකරගත් මිනිසත් බවින් පිරිපුන් පරිත්‍යාගශීලීන් පිරිසක් අරමුදල වෙත සිය මුල්‍යමය දායකත්වය ලබාදී ඇත. ඔවුන්වෙත අපගේ ප්‍රණාමය පුදකිරීමට මෙය අවස්ථාවක් කර ගන්නෙමු. ඔවුන්ගේ අනුග්‍රහයෙන් 2020 වර්ෂයේදී ශිෂ්‍යත්ව 08ක්ද 2021 වර්ෂයේදී ශිෂ්‍යත්ව 10ක්ද පිරිනැමීමට අපට හැකිවිය. අරමුදල ආරම්භකර වසර දෙකක් ගතවන මේ මොහොතේ විශ්වවිද්‍යාල වරම් ලද තවත් දරුවන් 10 දෙනෙකුට ඔවුන්ගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා අත්වැලක් සැපයීමට හැකිවීම අප සියලුදෙනාටම ඉමහත් සතුටට කරුණකි. මෙම එක් ශිෂ්‍යත්වයක වටිනාකම රුපියල් 30,000/- කි. එය වර්ෂයකට රුපියල් 10,000/- බැගින් වාරික තුනකින් ගෙවනු ලැබේ. ඒ අනුව, අද දින සිසුන් 08 දෙනෙකු ඔවුන්ගේ තෙවැනි ශිෂ්‍යත්ව වාරිකයද, සිසුන් 10 දෙනෙකු ඔවුන්ගේ දෙවැනි ශිෂ්‍යත්ව වාරිකයද, තවත් සිසුන් 10 දෙනෙකු ඔවුන්ගේ ප්‍රථම ශිෂ්‍යත්ව වාරිකයද වශයෙන් සිසුන් 28 දෙනෙකු රුපියල් 2,80,000/- ක මුදලක් ශිෂ්‍යත්ව වශයෙන් ලබයි. ඉදිරියේදී ආර්. බී. නිශ්ශංක ප්‍රණාම උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල මගින් වැල්ලවාය ප්‍රදේශයෙන් විශ්වවිද්‍යාල වරම් ලබන දරුවන් වැඩිපිරිසකට ශිෂ්‍යත්ව පිරිනැමීම අපගේ අපේක්ෂාව වේ.

අද දින ශිෂ්‍යත්ව ලබන සියලුම ශිෂ්‍යත්වලාභීන්ට ආර්. බී. නිශ්ශංක ප්‍රණාම උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදලේ සියලුම සාමාජිකයන් වෙනුවෙන් අපගේ සුභාශිංසන පිරිනමමු.

**විධායක කමිටුව**
**ආර්. බී. නිශ්ශංක ප්‍රණාම උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල - වැල්ලවාය**

## අරමුදලේ ගරු අනුශාසක නුගේයායේ නන්දසාර ස්වාමීන් වහන්සේගේ පණිවුඩය

### *ආර්. බී. නිශ්ශංක ප්‍රණාම උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව වැඩසටහන*

මො/මල්වත්තාවල ජාතික පාසලේ විශ්‍රාමික විදුහල්පති ආර්. බී. නිශ්ශංක ශ්‍රීමතාණන්ට ගරු කිරීමක් වශයෙන් එතුමාගෙන් සිප් සතර හදාල ආදි ශිෂ්‍ය කණ්ඩායමක් විසින් දැයේ දූ පුතුන්ගේ වාසනාවට පිහිටුවා පවත්වාගෙන යන ආර්. බී. නිශ්ශංක ප්‍රණාම උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව වැඩසටහන වෙනුවෙන් මෙවරද අදහසක් ඉදිරිපත් කිරීමට ලැබීම පළමු කොට අගේ කොට සලකමි.

නවක ගුරු භවතකු වශයෙන් සේවයට එක්වූ අපටද ගුරු භූමිකාව සාර්ථක කර ගැනීමට ගුරු පියෙකු වශයෙන් මග පාදාදුන් ආර්. බී. නිශ්ශංක විදුහල්පති තුමාගෙන් මො/මල්වත්තාවල ජාතික පාසල හරහා දැයේ දූ දරුවන්ට සිදුවූ මෙහෙවර අපමණය. අපේ රටේ සේවය කරන ආදී ශිෂ්‍ය ශිෂ්‍යාවන් බොහෝ දෙනෙකුට ගුරු පියෙකු වූයේ මෙතුමාය.

උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ, විශ්වවිද්‍යාල අධ්‍යාපනය හදාරණ දූ පුතුන් සමූහයකට අත්වැලක් වූ මෙම වැඩසටහනින් මෙවරද සිසුන් පිරිසකට එම වාසනාව ලැබීම සතුටට කරුණකි.

ආර්. බී. නිශ්ශංක ගුරු පියාණන්ට ගරු කිරීමක් වශයෙන් පිහිටුවා ඇති උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල දිනෙන් දින දියුණුවට පත්වේවා! එමගින් දැයේ දූ පුතුන්ට විශාල මෙහෙවරක් සැලසේවා!

පුරාණ වැලිගම්වෙහෙර රජ මහා විහාරය,
කොටවෙහෙරගල ගල්ලෙන් රජ මහා විහාරය හා
ළිඳේආර ශ්‍රී හේමාලෝක අභිනවාරාමාධිපති,
වැල්ලවාය ප්‍රාදේශීය විහාරාධිපති සංගමයේ
ගරු ලේඛකාධිකාරී, විශ්‍රාමික විදුහල්පති,

**ගරුතර නුගේයායේ නන්දසාර**
**මහා ස්ථවිරපාදයන් වහන්සේ**
පුරාණ වැලිගම්වෙහෙර,
වැලිආර,
වැල්ලවාය.

## අරමුදලේ ගරු සම අනුශාසක විශ්‍රාමලත් විදුහල්පති ආර් බී නිශ්ශංක ගුරු පියාණන්ගේ පණිවුඩය

මා මල්වත්තාවල ජාතික පාසලේ අවුරුදු අටක පමණ කාලයක් විදුහල්පති ලෙස සේවය කළෙමි. එම කාලය තුළ ගුරු මණ්ඩලයෙන් ලැබුනු සහයෝගය නිසා මල්වත්තාවල විද්‍යාලය එක්තරා මට්ටමකට දියුණුකළ හැකිවිය. ඒ අනුව වැටුපට වඩා වැඩි සේවයක් විදුහලට ලබා දුනිමි. සතියේ සෑම දිනකම පාහේ සවස පංති පවත්වා විෂය නිර්දේශ නිම කිරීමට සහය වූ ගුරු පියවරුන්ට සහ ගුරු මෑනිවරුන්ට පිං දීමෙන් ස්තුතිය පලකරමි.

විදුහලක් දියුණුවකරා ගෙනයාමට විෂය බාහිර ක්‍රියාකාරකම්ද ඉතා අවශ්‍යය. එයිනුත් ප්‍රධාන තැන ගනු ලබන්නේ ක්‍රිඩා කටයුතුය. ක්‍රීඩා ගුරු මහතාගේ මග පෙන්වීම යටතේ ක්‍රිඩා අංශය සහ බාහිර ක්‍රියාකාරකම් තුළින්ද පාසල සංවර්ධනය විය.

විදුහලේ ඉහත සඳහන් පසුබිම යටතේ බුද්ධිමත්, උගත්, ක්‍රියාශීලි දරු පරපුරක් ඇතිවිය. එයින් උසස්ම දක්ෂතා ඇති ආදී විද්‍යාර්ථීන් කණ්ඩායමක් එකතුවී ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී දක්ෂ දරුවන් පිරිසක් ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීමට ගත් උත්සාහය වැල්ලවාය ප්‍රදේශයටම ශක්තියකි. දිරිගැන්වීමකි. දෙමාපියන්ටද සහනයකි. ඒ වගේම, මාගේ සිහිනයක් සැබෑකර දීමකි. එසේම, ආදී විද්‍යාර්ථීන් තුළ ඇති මෙම ශක්තීන් තවත් පුළුල්කර විදුහලේ විවිධ අංශ දියුණුකර දරුවන්ගේ අධ්‍යාපන තත්ත්වය ඉහළ දැමීමට කටයුතු කරන්නේනම් මැනවි.

තුන්වන වරටත් නොකඩවා මෙම වැඩසටහන සංවිධානය කිරීම ගැන මො/මල්වත්තාවල විදුහලේ ආදී විද්‍යාර්ථීන්ට මාගේ ස්තුතිය පලකරමි. එසේම අවට පාසල් වලින්ද දක්ෂ දරුවන් තෝරා ගැනීමෙන් කදිම ආදර්ශයක් දී ඇත. එම විදුහල් වලින්ද එම කාර්ය සඳහා ලබාදී ඇති සහයෝගය සම්බන්ධයෙන් එම විදුහල්වල විදුහල්පති තුමන්ලාටද ස්තුති කරමි. මෙම කටයුත්ත විශිෂ්ට ලෙස සංවිධානය කිරීම ගැන මාගේ ආශිර්වාදාත්මක ස්තුතිය පලකරමි. මො/මල්වත්තාවල මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති තුමා සහ ආචාර්ය මණ්ඩලයටද මාගේ ස්තුතිය පල කරමි.

විශේෂයෙන්ම මෙම කර්යය සාර්ථක කර ගැනීමට ස්වකැමැත්තෙන් ඉදිරිපත්ව අනුග්‍රහය දැක්වූ පරිත්‍යාගශීලීන්ටද මාගේ ගෞරවනීය ස්තුතිය පලකරමි.

මෙම අරමුදල තවතවත් ශක්තිමත් කර ගැනීමට, අරමුදලේ සාමාජික මහත්ම මහත්මීන්ට ශක්තිය සහ ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

**ආර්. බී. නිශ්ශංක**
විශ්‍රාමික නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ

## කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ පණිවුඩය

ජීවිතය පිරිපුන් වීමට උසස් අධ්‍යාපනය ලබාගැනීම අතිශය වැදගත්වේ. එහෙත් උසස් අධ්‍යාපනය ලැබීමට අවස්ථාව ලැබෙන්නේ සුළු පිරිසකටයි. මේ සඳහා විවිධ හේතු බලපායි. මෙවැනි තත්ත්වයක උසස් අධ්‍යාපනය ලැබීම සඳහා දිරියක් වීම පිණිස ගත් උත්සාහයක් ලෙස මෙම වැඩසටහන දකිමි.

මො/මල්වත්තාවල මධ්‍ය මහා විද්‍යාලයේ ආදී ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින් හා සුබපතන්නන්ගේ සහභාගීත්වයෙන් ගොඩ නැගෙන **ආර් බී නිශ්ශංක ප්‍රණාම** උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල මා ඉතා ඉහළින් අගය කරන කටයුත්තකි.

වැල්ලවාය ප්‍රදේශයේ උසස් අධ්‍යාපනයට ශක්තියක්වන මෙම වැඩසටහන දිනෙන්දින වර්ධනයවී ප්‍රදේශයේ දරුදැරියන්ගේ අනාගතය දීප්තිමත් කිරීමට අවශ්‍ය ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

**ඒ. ඩබ්. සේමපාල**
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, වැල්ලවාය

---

## මො/මල්වත්තාවල ජාතික පාසලේ විදුහල්පති තුමාගේ පණිවුඩය

### *අනාගතය සඳහා මානව සම්පත බලගැන්වීමට...*

ප්‍රදේශයේ ප්‍රමුඛ අධ්‍යාපන කේන්ද්‍රස්ථානයක් ලෙස දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රාදේශීය මානව සම්පත නිමැවුමෙහි තෝතැන්නක් වන මො/මල්වත්තාවල මධ්‍ය මහා විද්‍යාලයේ කීර්තිමත් ආදී සිසුන් එක්ව, හිටපු කීර්තිමත් විදුහල්පති  ආර් බී නිශ්ශංක මැතිතුමා නමින් පිහිටුවා, තෙවන වරටත් දියත් කරන උපාධි අපේක්ෂක ශිෂ්‍යත්ව ප්‍රදානය කරන අවස්ථාවේ සුබ පැතුම් එක් කරන්නේ අභිමානය මුසු සොම්නසකිනි.

ප්‍රාදේශීය දුෂ්කරතා ජය ගැනීමට වඩාත්ම ඵලදායී උපාය මාර්ගය අධ්‍යාපනය බල ගැන්වීමයි. එහිදී ඉතා නුදුරු අනාගතයේ ප්‍රදේශයේ ශ්‍රම බලකාය සවිමත් කරන විශ්වවිද්‍යාල වරම් ලබා සිටින දූ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් අත්වැල් සැපයීම ප්‍රාදේශීය මානව සම්පත බලගැන්වීමෙහිලා තෝරන ලද උචිත මධ්‍යකාලීන උපාය මාර්ගයක් ලෙස අගය කළ යුතුය.

මෙම ශිෂ්‍යත්වයේ ආධාරය ලබන උපාධි අපේක්ෂක දූ දරුවන් ද තම උසස් අධ්‍යාපනය සම්පූර්ණ කර ගැනීමට මෙන්ම ඉන් අනතුරුව උසස්-ගුණාත්මක වැඩ ආකල්ප සහිතව උපන් ගම, උපන් බිම ආදරයෙන් නගාසිටුවීමට දායකවන මානව සම්පතක් බවට පත්වීමට ද සිහි තබා කටයුතු කළ යුතුය.

**වී. ව. නයන මංගල**
විදුහල්පති, මො/මල්වත්තාවල මධ්‍ය මහා විද්‍යාලය

**මො/කුඩාඔය මහා විද්‍යාලයේ විදුහල්පති තුමාගේ පණිවුඩය**

***නැණ නුවන දල්වන්න - දිරිය දුනි බැබලෙන්න***
***ඔබගේ ගුණ අගයන්න - බැරිය වදනින් ඔන්න***

මිනිසාගේ පරම යුතුකම මිනිසාට සේවය කිරීම බව පසක් කරමින් මිනිසත්කම පිරිහෙමින් පවතින මෙවන් යුගයක දැයේ දරුවන්ගේ නැණ ගුණ දම් පෝෂණය කරමින් යහපත් අනාගත දරු පරපුරක් දැයට දායාද කිරීමේ අරමුණ පෙරටු කරගනිමින් දරුවන්ගේ ඉදිරි අධ්‍යාපන කටයුතු බාධවකින් තොරව කරගෙන යාමට යෝධ පවුරක් සේ සංවිධානය වූ ඔබගේ ආර් බී නිශ්ශංක ප්‍රණාම උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල මගින් මො/කුඩාඔය විද්‍යාලයේ උසස් අධ්‍යාපනය ලබා විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන කෞෂල්‍යා දියණියගේ අධ්‍යාපන කටයුතු වෙනුවෙන් ලබාදුන් දිරියට සවියට තුති පුදන අතරම අනාගත දරු පරපුර වෙනුවෙන් මෙවැනි සත් ක්‍රියාවන් කිරීමට දිරිය ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

**එන් ඒ ලලිත් සුරවීර**
**විදුහල්පති**

මො/කුඩාඔය මහා විද්‍යාලය
උඩව-කුඩාඔය
තණමල්විල

# ආර්. බී. නිශ්ශංක ප්‍රණාම උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල

# ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

මොණරාගල දිස්ත්‍රික්කයේ, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි පාසල් වලින් අ.පො.ස. (උසස් පෙළ) සමත්ව විශ්වවිද්‍යාල අධ්‍යාපනයට පිවිසෙන ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල්වල දක්ෂ දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවලට උපකාර කිරීම පිණිස ආර්. බී. නිශ්ශංක ප්‍රණාම උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල 2020 ජනවාරි මාසයේදී පිහිටුවන ලදී. අරමුදලේ බැරට ඇති මුදල් බලපත්‍රලාභී ප්‍රධාන මූල්‍ය ආයතන සමග ආයෝජනය කිරීමෙන් ලැබෙන පොළී ආදායමෙන් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම අරමුදලේ මූලික ක්‍රමෝපායයි. අරමුදල් රැස්කිරීම දැනට සිදුකරණු ලබන්නේ මෙවැනි සත්කාර්යයන්ට අතහිත දෙන පරිත්‍යාගශීලීන්ගේ දායකත්වයෙනි. අරමුදලේ සාමාජිකයින් වන්නේ වැල්ලවාය මො/මල්වත්තාවල ජාතික පාසලේ ආදී ශිෂ්‍යයන්ය. දැනට අරමුදලේ සාමාජික සංඛ්‍යාව 65 කි. අරමුදලේ ප්‍රධාන නිලධාරීන්ගෙන් සමන්විත විධායක කමිටුව මගින් අරමුදල් කළමනාකරණය සිදුකරනු ලැබේ. වැල්ලවාය ප්‍රදේශයේ පාසල් අධ්‍යාපනයට ඉමහත් සේවයක් ඉටුකළ මල්වත්තාවල ජාතික පාසලේ හිටපු විදුහල්පති ආර්. බී. නිශ්ශංක ගුරුපියාණන්ගේ නමින් අරමුදල නම් කර ඇත. මෙම අරමුදල වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අංක 251/2020 යටතේ ලියාපදිංචි කර ඇත.

වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පිහිටි අ.පො.ස. (උසස් පෙළ) පංති පැවැත්වෙන විදුහල් සංඛ්‍යාව 06කි. එවානම්, මො/මල්වත්තාවල ජාතික පාසල, මො/ජේ.එම්. කුමාරදාස මහා විද්‍යාලය, මො/ බුදුරුවාගල මහා විද්‍යාලය, මො/වෙහෙරයාය මහා විද්‍යාලය, මො/ඇතිලිවැව මහා විද්‍යාලය සහ මො/කුඩාඔය මහා විද්‍යාලය වේ. මෙම විදුහල් වලින් සාමාන්‍යයෙන් වර්ෂයකට අ.පො.ස. (උසස් පෙළ) විභාගයට සිසුන් 350 - 400 ක් පමණ පෙනී සිටින අතර ඉන් සිසුන් 50 – 60 අතර සංඛ්‍යාවක් රාජ්‍ය විශ්වවිද්‍යාල වලට තෝරාගැනේ. ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා අප අරමුදල විසින් වාර්ෂිකව ඉහත විදුහල්වල විදුහල්පතිතුමන්ලා හරහා අයදුම්පත් කැඳවනු ලැබේ. සාමාන්‍යයෙන් වර්ෂයකට සිසුන් 20 - 25 පමණ ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් ඉදිරිපත් කරයි. එහෙත් දැනට අරමුදලට හැකියාව ඇත්තේ වර්ෂයකට ශිෂ්‍යත්ව 10 ක් පමණ පිරිනැමීමටය. එහෙයින්, විශේෂයෙන්ම පවුලේ ආදායම් මට්ටම සහ ශිෂ්‍යයාගේ විෂය සහ විෂය බාහිර දක්ෂතාවයන් යන නිර්නායකයන් යටතේ ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා වඩාත් සුදුසු සිසුන් තෝරා ගැනේ. මෙම ශිෂ්‍යත්ව ක්‍රමය යටතේ එක් ශිෂ්‍යයෙකුට වර්ෂයකට රුපියල් 10,000/- බැගින් වසර තුනකදී රුපියල් 30,000/- ක මුදලක් පිරිනැමේ.

2020 වර්ෂයේදී ශිෂ්‍යත්ව 08 ක්ද, 2021 දී ශිෂ්‍යත්ව 10 ක්ද, 2022 දී ශිෂ්‍යත්ව 10 ක්ද වශයෙන් මේ වන විට රුපියල් 8,40,000 ක් වටිනා ශිෂ්‍යත්ව 28 ක් පිරිනමා ඇත. අරමුදලේ ආයෝජන වලින් ප්‍රමාණවත් ආදායමක් තවම නොලැබෙන බැවින් මෙම සියලුම ශිෂ්‍යත්ව පිරිනමනු ලැබුයේ ඒ සඳහා විශේෂ අනුග්‍රහය දැක්වූ පරිත්‍යාගශීලීන්ගේ දායකත්වයෙනි. එමෙන්ම, එවැනිම පරිත්‍යාගශීලීන්ගේ දායකත්වයෙන් අප විසින් ශිෂ්‍යත්ව අරමුදලක්ද ගොඩනගා තිබේ. එය සතුව දැනට රුපියල් ලක්ෂ 25ක පමණ අරමුදලක් ඇත. වර්තමානයේ පවතින පොළී අනුපාතික යටතේ එම මුදල දිගුකාලීනව ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායමෙන් වර්ෂයකට ශිෂ්‍යත්ව 10ක් පමණ ප්‍රදානය කිරීමට අපට හැකිවනු ඇත. මෙම

ශිෂ්‍යත්ව සංඛ්‍යාව මෙන්ම ශිෂ්‍යත්වයක වටිනාකමද ප්‍රමාණවත් නොවන බව අපගේ වැටහීමයි. එම නිසා, මෙම ශිෂ්‍යත්ව අරමුදල ඉදිරියේදී තවදුරටත් වැඩිකර ගැනීම සහ වැඩි ශිෂ්‍යත්ව ප්‍රමාණයක් පිරිනැමීම අපගේ අපේක්ෂාවයි.

ආර්. බී. නිශ්ශංක ප්‍රණාම උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදලවෙත ඔබට යම් පරිත්‍යාගයක් කිරීමට හැකිනම් එය අප ඉතා අගයකොට සළකමු. එය දුෂ්කර ප්‍රදේශයක, අඩු ආදායම්ලාභී පවුලක, දක්ෂ සිසුවකුගේ නැණස පෑදීමට කරන ආයෝජනයක් මෙන්ම පුණ්‍යකර්මයක් ද වනු ඇත. ඔබගේ ආධාර මුදල මෙන්ම ඉන් ලැබෙන පොළී ආදායම ද සම්පූර්ණයෙන්ම ශිෂ්‍යත්ව පිරිණැමීමට පමණක්ම යොදන බවට අප සහතික වෙමු. අරමුදලේ පරිපාලන වියදම් ඇතුලු සෑම වියදමක්ම සම්පූර්ණයෙන්ම සාමාජිකයන්ගේ පුද්ගලික දායකත්වයෙන් සිදුකෙරේ. අරමුදලේ කටයුතු අභ්‍යන්තර විගණන මහතෙකු විසින් අඛණ්ඩව සිදුකරන අතර, බාහිර විගණනයක් ද ඒ පිළිබඳ වෘතීය සුදුසුකම්ලත් පුද්ගලයෙකු විසින් වාර්ෂිකව සිදුකරනු ඇත. එමනිසා, ඔබගේ පරිත්‍යාගයෙන් අරමුදලට ලැබෙන ආදායම අනිවාර්යයෙන්ම එය ලැබීමට සුදුසු ශිෂ්‍යයන් වෙත අසීමිත කාලයක් ඉදිරියට ලැබෙන බව අපට සහතික කළ හැකිය.

ඔබගේ පරිත්‍යාගය පහත විස්තර දී ඇති පරිදි එවිය හැකිය:

ගිණුමේ නම: **ආර්. බී. නිශ්ශංක ප්‍රණාම උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල**
බැංකුව හා ශාඛාව: **ලංකා බැංකුව, වැල්ලවාය**
ගිණුම් අංකය: **85489425**

ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීමට විශේෂ අනුග්‍රහය දැක්වූ පරිත්‍යාගශීලීන්ට සහ අරමුදල ගොඩනැගීම සඳහා අනුග්‍රහය දැක්වූ පරිත්‍යාගශීලීන්ට අපගේ ගෞරවනීය ප්‍රණාමය පුදකිරීමට මෙය අවස්ථාවක් කරගනිමු.

**විධායක කමිටුව**
**ආර්. බී. නිශ්ශංක ප්‍රණාම උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල - වැල්ලවාය**

# ආර් බී නිශ්ශංක ප්‍රණාම උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල - වැල්ලවාය

## අරමුදලේ නිළධාරී මණ්ඩලය

1. ගරු අනුශාසකවරු:
    i. ගරු නුගයායේ නන්දසාර ස්වාමීන් වහන්සේ, විශ්‍රාමලත් විදුහල්පති
    ii. ගරු ආර් බී නිශ්ශංක මැතිතුමා, විශ්‍රාමලත් විදුහල්පති
    iii. ගරු නයන මංගල මැතිතුමා, විදුහල්පති, මො/මල්වත්තාවල ජාතික පාසල, වැල්ලවාය
2. සම සභාපතිවරු: එස් හෙට්ටිආරච්චි මහතා, ලේකම්, සංචාරක අමාත්‍යංශය
   කේ ඩී රණසිංහ මහතා, විශ්‍රාමික නියෝජ්‍ය අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව
3. උප සභාපති: ඒ ජී සිරිනිමල් මහතා, විශ්‍රාමික සහකාර සාමාන්‍යාධිකාරී, ලංකා බැංකුව
4. සම ලේකම්වරු: ඩී එම් කුසුම්සිරි ජයතිලක මහත්මිය, ශ්‍රී ලංකා ගුරු සේවය, මො/මල්වත්තාවල ප්‍රාථමික විද්‍යාලය
   ජේ එම් ජයතිලක මහතා, විශ්‍රාමික සහකාර නිෂ්පාදන කළමණකරු, පැල්වත්ත සීනි සමාගම
5. භාණ්ඩාගාරික: බුද්ධදාස දන්දෙණිය මහතා, විශ්‍රාමලත් විදුහල්පති
6. සහකාර භාණ්ඩාගාරික: ජගත් කළුබෝවිල මහතා, කළමණාකරු, මහජන බැංකුව, මොණරාගල
7. නීති උපදේශක: නීතිඥ අජිත් ලියනආරච්චි මහතා, අලුත් පාර, වැල්ලවාය
8. ගිණුම් පරීක්ෂක: ජී ඩී ගුණරත්න මහතා, විශ්‍රාමික ගුරු උපදේශක
9. කැඳවුම්කරු සහ ප්‍රධාන සංවිධායිකා: වෛද්‍ය සුභාශිනී ගොඩගේ මහත්මිය, රජයේ රෝහල, බුත්තල
10. කාරක සභාව:
    i. ආර් උදේනි ජයන්තිමාලා මහත්මිය
    ii. පි කාංචන මාලා ගොඩගේ මහත්මිය
    iii. විල්සන් හේවගේ මහතා
    iv. ඩී බුද්ධික සුරංග මහතා
    v. ආර් එම් සෝමලතා මහත්මිය
    vi. කේ පී මාලනී මල්කාන්ති මහත්මිය
    vii. එච් කේ පි චාන්දනී ජයරත්න මහත්මිය

## ආර් බී නිශ්ශංක ප්‍රණාම උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල

## ශිෂ්‍යත්ව ප්‍රදානෝත්සවයේ වැඩසටහන

දිනය : 2022 අප්‍රේල් 17

වේලාව : පෙ. ව. 08:30

ස්ථානය : මො / මල්වත්තාවල ජාතික පාසල, රංග ශාලාව

මෙහෙයවීම: අරමුදලේ භාණ්ඩාගාරික බුද්ධදාස දන්දෙණිය මහතා, උප සභාපති ඒ ජී සිරිනිමල් මහතා සහ සංවිධායිකා වෛද්‍ය සුභාෂිණී ගොඩගේ මහත්මිය

පෙ. ව. 08:30 – පෙ. ව. 09:00 - අරමුදලේ නිලධාරීන් විසින් ආරාධිතයින් පිළිගැනීම සහ අසුන් ගැන්වීම

පෙ. ව. 09:05 - ආගම සිහිකිරීම

පෙ. ව. 09:10 - සම්ප්‍රදායානුකූලව පොල්තෙල් පහන දැල්වීම

පෙ. ව. 09:15 - හිටපු භාණ්ඩාගාරික අභාවප්‍රාප්ත ඩබ් එම් ප්‍රේමරත්න මහතා සිහිකිරීම

පෙ. ව. 09:20 - පිළිගැනීම සහ අරමුදලේ ප්‍රගතිය - සම සභාපති කේ ඩී රණසිංහ මහතා

පෙ. ව. 09:30 - ප්‍රධාන අනුශාසනාව - ගරු නුගයායේ නන්දසාර ස්වාමීන් වහන්සේ

පෙ. ව. 09:40 - ශිෂ්‍යත්වලාභීන් තෝරාගත් ආකාරය පැහැදිලි කිරීම - උප සභාපති ඒ ජී සිරිනිමල් මහතා

පෙ. ව. 09:50 - මො / මල්වත්තාවල ජාතික පාසලේ සිසු සිසුවියන් ඉදිරිපත්කරන පූජා නැටුම

පෙ. ව. 09:55 - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තුමාගේ අදහස් දැක්වීම

පෙ. ව. 10:00 - මො / මල්වත්තාවල ජාතික පාසලේ විදුහල්පතිතුමාගේ අදහස් දැක්වීම

පෙ. ව. 10:10 - තේ පැන් සංග්‍රහය

පෙ. ව. 10:30 - ශිෂ්‍යත්වලාභී ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ශිෂ්‍යත්ව පිරිනැමීම - 2020

පෙ. ව. 10:40 - ශිෂ්‍යත්වලාභී ශිෂ්‍යයෙක් / ශිෂ්‍යාවක් විසින් කරනු ලබන ඉදිරිපත් කිරීමක්

පෙ. ව. 10:45 - ශිෂ්‍යත්වලාභී ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ශිෂ්‍යත්ව පිරිනැමීම - 2021

පෙ. ව. 10:55 - විශේෂ අදහස් දැක්වීම - ප්‍රියංවදා ගොඩගේ මහත්මිය

පෙ. ව. 11:05 - ශිෂ්‍යත්වලාභී ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ශිෂ්‍යත්ව පිරිනැමීම - 2022

පෙ. ව. 11:15 - ශිෂ්‍යත්වලාභී ශිෂ්‍යයෙක් / ශිෂ්‍යාවක් විසින් කරනු ලබන අදහස් දැක්වීම

පෙ. ව. 11:20 - ශිෂ්‍යත්වලාභී ශිෂ්‍යයෙක් / ශිෂ්‍යාවක් විසින් කරනු ලබන ඉදිරිපත් කිරීමක්

පෙ. ව. 10:25 - අරමුදලේ සම සභාපති එස් හෙට්ටිආරච්චි මහතාගේ අදහස් දැක්වීම

පෙ. ව. 11:35 - අරමුදලේ ප්‍රධාන අනුශාසක ගරු ආර් බී නිශ්ශංක හිටපු විදුහල්පති තුමාගේ අදහස් දැක්වීම

පෙ. ව. 11:45 - ස්තුති කථාව - ගරු ලේකම් කුසුම්සිරි ජයතිලක මහත්මිය

පෙ. ව. 11:50 - සමාප්තිය


**2020 වර්ෂයේ ශිෂ්‍යත්වලැබූ ශිෂ්‍යත්වලාභීන්ගේ තොරතුරු**
**(2022 අප්‍රේල් 17 දින ඔවුන්ට තෙවන ශිෂ්‍යත්ව වාරිකය පිරිනැමේ)**

| | |
|---|---|
| **1. එච් එම් විශ්ව මදුශාන් මහතා**<br>හඳපානාගල<br><br>පාසල : මල්වත්තාවල ජාතික පාසල,, වැල්ලවාය<br>විශ්වවිද්‍යාලය : කැළණිය විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : කළමණාකරන |  |
| **2. කේ ඒ දිල්කි වත්සලා මෙනවිය**<br>වැල්ලවාය<br><br>පාසල : මො/බුදුරුවාගල මහා විද්‍යාලය,<br>විශ්වවිද්‍යාලය : කැළණිය විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : කළමණාකරන |  |
| **3. එන් ඒ ඩී මදුෂාණි ආරියරත්න මෙනවිය**<br>වැල්ලවාය<br><br>පාසල :මො/ජේ එම් කුමාරදාස මහා විද්‍යාලය,<br>විශ්වවිද්‍යාලය : පේරාදෙණිය විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : කලා |  |
| **4. පි එම් නිසංසලා සෙව්වන්දි මෙනවිය**<br>වැල්ලවාය<br><br>පාසල : මො/බුදුරුවාගල මහා විද්‍යාලය<br>විශ්වවිද්‍යාලය : රුහුණ විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : කළමණාකරන |  |

| | |
|---|---|
| **5. එම් එස් අමිල් අහමඩ් සිරාජුද්දීන් මහතා**<br>නුගයාය, වැල්ලවාය<br><br>පාසල: මො/මල්වත්තාවල ජාතික පාසල,<br>විශ්වවිද්‍යාලය : රුහුණ විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : කළමණාකරන |  |
| **6. ආර් ඒ චන්දිමා දිල්රුක්ෂි මෙනවිය**<br>වැල්ලවාය<br><br>පාසල: මො/ජේ එම් කුමාරදාස මහා විද්‍යාලය,<br>විශ්වවිද්‍යාලය : කැළණිය විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : කලා |  |
| **7. බි වි දිල්ශාන් සුරංජය මහතා**<br>වැල්ලවාය<br><br>පාසල: මො/මල්වත්තාවල ජාතික පාසල,<br>විශ්වවිද්‍යාලය : සබරගමුව විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : කළමණාකරන |  |
| **8. ඩබ්. අජිත් කුමාර මහතා**<br>වැල්ලවාය<br><br>පාසල: මල්වත්තාවල ජාතික පාසල<br>විශ්වවිද්‍යාලය : රජරට විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : ඉංජිනේරු තාක්ෂණවේදය |  |


**2021 වර්ෂයේ ශිෂ්‍යත්වලැබූ ශිෂ්‍යත්වලාභීන්ගේ තොරතුරු**
**(2022 අප්‍රේල් 17 දින ඔවුන්ට සිය දෙවන ශිෂ්‍යත්ව වාරිකය පිරිනැමේ)**

| | |
|---|---|
| **1. ඩබ් එම් එස් සඳමිණි බණ්ඩාර මෙනවිය**<br>වැල්ලවාය<br><br>පාසල : බුදුරුවාගල මහා විද්‍යාලය, වැල්ලවාය<br>විශ්වවිද්‍යාලය : රුහුණ විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : කලා |  |
| **2. එම් ආර් එම් උෂාන් මහතා**<br>යාලබෝව, වැල්ලවාය<br><br>පාසල : බුදුරුවාගල මහා විද්‍යාලය, වැල්ලවාය<br>විශ්වවිද්‍යාලය : රුහුණ විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : කලා |  |
| **3. එච් එම් සංසලා නිලුපුලී මෙනවිය**<br>වැල්ලවාය<br><br>පාසල : ජේ එම් කුමාරදාස මහා විද්‍යාලය, වැල්ලවාය<br>විශ්වවිද්‍යාලය : මොරටුව විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : පහසුකම් කළමණාකරනය |  |
| **4. ඒ කේ මදුමාලි මෙනවිය**<br>උඟුව-කුඩාඔය, තණමල්විල<br><br>පාසල : කුඩාඔය මහා විද්‍යාලය, වැල්ලවාය<br>විශ්වවිද්‍යාලය : කැළණිය විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : කළමණාකරනය |  |
| **5. ඩබ් ඩී මදුරි නිසංසලා හේමමාලී  මෙනවිය**<br>වැල්ලවාය<br><br>පාසල: මල්වත්තාවල ජාතික පාසල, වැල්ලවාය<br>විශ්වවිද්‍යාලය : ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : ක්‍රීඩා විද්‍යාව |  |

| | |
|---|---|
| **6. එච් ඒ කේ නෙත්මා තරුෂි   මෙනවිය**<br>ඇතිලිවැව<br><br>පාසල: ඇතිලිවැව මහා විද්‍යාලය, වැල්ලවාය<br>විශ්වවිද්‍යාලය : රුහුණ විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : කලා |  |
| **7. ඩබ් ඩී දිලිණි කෞෂල්‍යා මෙනවිය**<br>ඇතිලිවැව<br><br>පාසල: ඇතිලිවැව මහා විද්‍යාලය, ඇතිලිවැව<br>විශ්වවිද්‍යාලය : රුහුණ  විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : කළමණාකරනය |  |
| **8. කේ ජී නයෝමි දර්ශිකා තෙන්නකෝන් මෙනවිය**<br>වැල්ලවාය<br><br>පාසල: මල්වත්තාවල ජාතික පාසල, වැල්ලවාය<br>විශ්වවිද්‍යාලය : කැළණිය විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : කළමණාකරනය |  |
| **9. බී ඩබ්. දිල්රුක්ෂි සඳමාලි මෙනවිය**<br>ඇතිලිවැව<br><br>පාසල: ඇතිලිවැව මහා විද්‍යාලය, ඇතිලිවැව<br>විශ්වවිද්‍යාලය : ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : කළමණාකරනය |  |
| **10. ආර් ඩී දක්සිත ලක්රුවන්  මහතා**<br>වැල්ලවාය<br><br>පාසල: ජේ එම් කුමාරදාස මහා විද්‍යාලය, වැල්ලවාය<br>විශ්වවිද්‍යාලය : නැගෙනහිර විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : කළමණාකරනය |  |

**2022 වර්ෂයේ ශිෂ්‍යත්වලැබූ ශිෂ්‍යත්වලාභීන්ගේ තොරතුරු**
**(2022 අප්‍රේල් 17 දින ඔවුන්ට සිය ප්‍රථම ශිෂ්‍යත්ව වාරිකය පිරිනැමේ)**

| | |
|---|---|
| **1. ඩී එම් දිලුශි ඉමන්තිකා මෙනවිය**<br>ඌව කරදගොල්ල, ඇල්ල<br><br>පාසල: ජේ එම් කුමාරදාස මහා විද්‍යාලය, වැල්ලවාය<br>විශ්වවිද්‍යාලය : කොළඹ විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : කලා |  |
| **2. පී එම් සහන් මධුශානිකා මෙනවිය**<br>හඳපානාගල<br><br>පාසල: ජේ එම් කුමාරදාස මහා විද්‍යාලය, වැල්ලවාය<br>විශ්වවිද්‍යාලය : ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : කලා |  |
| **3. ඩබ් එම් ශ්‍රීලිකා කල්පනී සමරකෝන් මෙනවිය**<br>වැල්ලවාය<br><br>පාසල: මල්වත්තාවල ජාතික පාසල, වැල්ලවාය<br>විශ්වවිද්‍යාලය : වව්නියා විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : කළමණාකරන |  |
| **4. ඩබ් ඒ සුමුදු නිමල්කා මෙනවිය**<br>ඇතිලිවැව<br><br>පාසල: වෙහෙරයාය මහා විද්‍යාලය, වැල්ලවාය<br>විශ්වවිද්‍යාලය : කොළඹ විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : කලා |  |
| **5. ඒ ඩී චම්පා නිරෝෂිණී මෙනවිය**<br>හඳපානාගල<br><br>පාසල: මල්වත්තාවල ජාතික පාසල, වැල්ලවාය<br>විශ්වවිද්‍යාලය : කොළඹ විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : කලා |  |

| | |
|---|---|
| **6. ඩී එම් සදීපා සෙව්මිණි මෙනවිය**<br>ඇතිලිවැව<br><br>පාසල: ඇතිලිවැව මහා විද්‍යාලය, වැල්ලවාය<br>විශ්වවිද්‍යාලය : රුහුණ විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : කලා |  |
| **7. කේ වී ඩී හෂිණි දිල්රුක්ෂි මෙනවිය**<br>ඇතිලිවැව<br><br>පාසල: ඇතිලිවැව මහා විද්‍යාලය, වැල්ලවාය<br>විශ්වවිද්‍යාලය : ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : කළමණාකරන |  |
| **8. පී ඒ දේශානී ප්‍රබුද්ධිකා මෙනවිය**<br>හඳපානාගල<br><br>පාසල: බුදුරුවගල මහා විද්‍යාලය, වැල්ලවාය<br>විශ්වවිද්‍යාලය : රුහුණ විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : කලා |  |
| **9. කේ පී චතුරී ජයංගනී ලාලිත්‍යා මෙනවිය**<br>වැල්ලවාය<br><br>පාසල: මල්වත්තාවල ජාතික පාසල, වැල්ලවාය<br>විශ්වවිද්‍යාලය : රුහුණ විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : කලා |  |
| **10. ඒ එම් ඉන්දීවරී කෞෂල්‍යා මෙනවිය**<br>ඌව-කුඩාඔය<br><br>පාසල: මල්වත්තාවල ජාතික පාසල, වැල්ලවාය<br>විශ්වවිද්‍යාලය : කොළඹ විශ්වවිද්‍යාලය<br>පාඨමාලාව : කලා |  |

## 2020 වර්ෂයේ පිරිනැමුණු ශිෂ්‍යත්ව සඳහා අනුග්‍රහය දැක්වූ පරිත්‍යාගශීලීන්ගේ විස්තර

1. එස් හෙට්ටිආරච්චි මහතා
   ට්‍රිලියම් රෙසිඩන්සීස්, ඇල්විටිගල මාවත, කොළඹ 5

2. කේ ඩී රණසිංහ මහතා
   මිරිහාන, නුගේගොඩ

3. ඒ ජී සිරිනිමල් මහතා
   වීරසේකරගම, වැල්ලවාය

4. ඩී එම් කුසුම්සිරි ජයතිලක මහත්මිය
   වීරසේකරගම, වැල්ලවාය

5. ජගත් කළුබෝවිල මහතා
   වීරසේකරගම, වැල්ලවාය

6. ජ්‍යේෂ්ඨ නීතිඥ මාලනී කුලතිලක මහත්මිය
   කොටිකාවත්ත

7. ජ්‍යේෂ්ඨ නීතිඥ අමරාණි මුදලිගේ මහත්මිය
   ගම්පහ

8. එච් ආර් ඒ සි එන් එන් රත්නායක මහතා
   ශ්‍රී ලංකා මහ බැංකුව

## 2021 වර්ෂයේ පිරිනැමුණු ශිෂ්‍යත්ව සඳහා අනුග්‍රහය දැක්වූ පරිත්‍යාගශීලීන්ගේ විස්තර

1. නීතිඥ මාලනී තෙන්නකෝන් මහත්මිය
   පරණ ඇල්ල පාර, වැල්ලවාය

2. කේ ආර් කේ විජේසේකර මහත්මිය
   ඇල්ල පාර, වැල්ලවාය

3. ආර් එම් සුනේත්‍රා කුමාරිහාමි මහත්මිය,
   ආනපල්ලම, වැල්ලවාය

4. වයි එම් නිරෝෂන් උදය බුද්ධික මහතා,
   කොටවෙහෙරගල, වැල්ලවාය

5. ඒ ජී දමයන්ති මහත්මිය,
   යාලබෝව, වැල්ලවාය

6. ඒ ජී සනිඳු ප්‍රමුදිත මහතා,
   වීරසේකරගම, වැල්ලවාය

7. ඩබ් එම් ප්‍රේමචන්ද්‍ර මහතා,
   ගම්පහ, ඌව-මාවෙලගම

8. උදේනි ජයන්ති මාලා මහත්මිය,
   අලුත් පාර, වැල්ලවාය

9. නන්දසිරි රාජපක්ෂ මහතා,
   මොණරාගල පාර, වැල්ලවාය

10. එච් එම් එච් ඉම්තියාජ් මහතා,
    වැල්ලවාය

## 2022 වර්ෂයේ පිරිනැමුණු ශිෂ්‍යත්ව සඳහා අනුග්‍රහය දැක්වූ පරිත්‍යාගශීලීන්ගේ විස්තර

1. චූලා ජීවනී ආටිගල මහත්මිය
   නිවිතිගල, රත්නපුර

2. එස් ජී අජිත් මහතා,
   ප්‍රාදේශීය රෝහල, ඔක්කම්පිටිය

3. ඥානා හේවගේ මහත්මිය
   බුත්තල

4. එම් ඒ ස්වර්ණා මහත්මිය
   වරුණගම, වැල්ලවාය

5. ප්‍රියංවදා ගොඩගේ මහත්මිය
   ගොඩකවෙල

6. වෛද්‍ය සුභාෂිණී ගොඩගේ මහත්මිය
   වැල්ලවාය

7. නන්දා හෙන්නායක මහත්මිය
   දොඩම්ගස්ලන්ද

8. සුසන්ත ගුණවීර මහතා
   බුත්තල

9. ඩබ් එම් චන්ද්‍රසේන වීරකෝන් මහතා
   වැල්ලවාය

10. රූපිකා හෙට්ටිආරච්චි මහත්මිය
    ඇල්ල පාර, වැල්ලවාය

11. චතුර ඔබඩආරච්චි මහතා
    කොස්ලන්ද පාර, වැල්ලවාය

## ආර් බී නිශ්ශංක ප්‍රණාම උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදල - වැල්ලවාය

## ශිෂ්‍යත්ව අරමුදල ගොඩනැගීම සඳහා දායක වූ පරිත්‍යාගශීලීන්ගේ විස්තර

| | පරිත්‍යාගශීලියාගේ නම | ලිපිනය | ලද මුදල (රු) |
|---|---|---|---|
| 1 | සී පී ඒ කරුණාතිලක මහතා | දෙපානම, පන්නිපිටිය | 300,000.00 |
| 2 | සොසයිටි ඉංජිනීරින් (පුද්) සමාගම | යුනියන් පෙදෙස, කොළඹ 2 | 100,000.00 |
| 3 | එච් ඒ කරුණාරත්න මහතා | මාකොල පාර, කිරිබත්ගොඩ | 30,000.00 |
| 4 | වෛද්‍ය ශාන්තා හෙට්ටිආරච්චි මහත්මිය | ඇල්විටිගල මාවත, කොළඹ 5 | 50,000.00 |
| 5 | කේ ඩී රණසිංහ මහතා | මිරිහාන, නුගේගොඩ | 500,000.00 |
| 6 | එච් එස් සන්ධ්‍යා සිල්වා මහත්මිය | හයිලෙවල් පාර, පන්නිපිටිය | 50,000.00 |
| 7 | හර්බට් කුරේ ට්‍රස්ට් | නවම් මාවත, කොළඹ 2 | 500,000.00 |
| 8 | ආචාර්ය පී එන් වීරසිංහ මහතා | සිරිමල්වත්ත, කොට්ටාව | 30,000.00 |
| 9 | ආචාර්ය කණිෂ්ක අබේනායක මහතා | ටෙක්සාස්, ඇමරිකා එකසත් ජනපදය | 40,000.00 |
| 10 | මහාචාර්ය මහින්ද පළිහවඩන මහතා | පමුණුව පාර, මහරගම | 100,000.00 |
| 11 | මහාචාර්ය නලින් වික්‍රමාරච්චි මහතා | ඉංජිනේරු පීඨය, මොරටුව විශ්වවිද්‍යාලය | 250,000.00 |
| 12 | ආර් එම් රණසිංහ මෙනවිය | මිරිහාන, නුගේගොඩ | 200,000.00 |
| 13 | අ. වැදිවෙල මහතා | අලුත් වත්ත, වැලිආර, වැල්ලවාය | 7,500.00 |
| 14 | ඒ එම් ජයසේකර මහතා | කිරිල්ලවල, කඩවත | 25,000.00 |
| 15 | උපේඛ සිරිනුවන් මහතා | ගම්පහ, ඌව-මාවෙලගම | 20,000.00 |
| 16 | ඩබ් එම් කුමාරසිංහ මහතා | අන්නාසි කොටුව පාර, පන්නිපිටිය | 35,000.00 |
| 17 | හර්ෂණී හබරාදූව මහත්මිය | ලංකා බැංකුව, වැල්ලවාය | 10,000.00 |
| 18 | ජී ඩී ගුණරත්න මහතා | මල්වත්තාවල, වැල්ලවාය | 15,000.00 |
| 19 | බුද්ධදාස දන්දෙණිය මහතා | දිඹුලාමුරය, ඇල්ල පාර, වැල්ලවාය | 15,000.00 |
| 20 | නාරද වික්‍රමසිංහ මහතා | පරගස්මංකඩ, වැල්ලවාය | 25,000.00 |
| 21 | එස්. බස්නායක මහත්මිය | ඉසදින් නගරය, මාතර | 5,000.00 |
| 22 | වලිසිංහ කොඩිතුවක්කු | හෙට්ටිවීදිය, වැලිගම | 5,000.00 |
| 23 | ආර් එම් සුමේධ රත්නායක | සුමේධ හාඩ්වෙයාර්, යාලබෝව | 15,000.00 |
| | **එකතුව** | | **2,327,500.00** |

# IF

IF you can keep your head when all about you Are losing theirs and blaming it on you, If you can trust yourself when all men doubt you, But make allowance for their doubting too; If you can wait and not be tired by waiting, Or being lied about, don't deal in lies, Or being hated, don't give way to hating, And yet don't look too good,
nor talk too wise...

IF you can dream and not make dreams your master; If you can think and not make thoughts your aim; If you can meet with Triumph and Disaster And treat those two impostors just the same; If you can bear to hear the truth you've spoken twisted by knaves to make a trap for fools, Or watch the things you gave your life to, broken, And stoop and build 'em up with worn out tools...

IF you can make one heap of all your winnings And risk it on one turn of pitch-and-toss, And lose and start again at your beginnings And never breathe a word about your loss; If you can force your heart and nerve and sinew To serve your turn long after they are gone, And so hold on when there is nothing in you Except the Will which says to them "Hold on!"

IF you can talk with crowds and keep your virtue, Or walk with Kings nor lose the common touch, If neither foes nor loving friends can hurt you, If all men count with you, but none too much; If you can fill the unforgiving minute With sixty seconds' worth of distance run,
Yours is the Earth and everything that's in it, And which is more -
you'll be a Man, my son

written by Rudyard Kipling circa 1895